**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - 2018**

**----------------------------------------------------------**

**1.1 මතය**

**------**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් , සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේදී පුද්ගලික ආයතනයකට ගෙවිය යුතු වූ රු. 1,103,069 ක් සහ 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු වූ රු. 2,508,385 ක්ද සමාලෝචිත වර්ෂය දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පෞද්ගලික ආයතනයක් මගින් නිමකරන්නට යෙදුන අධ්‍යන අනධ්‍යාන නිල නිවාස ව්‍යාපෘතියට අදාළ අනුමත ඇස්තමේන්තු මුදලට වඩා විචල්‍යතාව 15% සීමාව ඉක්මවායාම මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇති අතර 2019 වර්ෂය තුළ අදාළ නිරවුල් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | ඇස්තමේන්තු විචල්‍යතාවයන් සියයට 10 කට අඩු මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කළ යුතු අතර ගෙවිය යුතු මුදල් නොපමාව නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | නීතිනීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (2) (ආ) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව තත්කාර්ය අතුරු අත්තිකාරම් මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 66 ක දී එකතුව රු.1,119,495 ක් නිකුත් කර තිබුණි. | විශ්ව විද්‍යාලයේ සාමාන්‍ය රාජකාරි කටයුතු සඳහා ප්‍රාායෝගික හේතූන් මත මාණ්ඩලික නිලධාරීන්ට පමණක් නොව මාණ්ඩලික නොවන නිලධාරීන්ටද අත්තිකාරම් නිකුත් කිරීම ඇතැම් විට සිදු වේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | | (ii) | තත්කාර්ය අත්තිකාරම් ලබාගත් නිලධාරියකු අදාළ කාර්යය නිමකළ විගසම එම අත්තිකාරම් පියවිය යුතු වුවද අවස්ථා 20 කදී ලබාගෙන තිබූ එකතුව රු. 711,112 ක් වූ අත්තිකාරම් ආපසු පියවීම දින 11 සිට දින 42 අතර කාල පරාසයක් ප්‍රමාදකර තිබුණි. | අත්තිකාරම් පියවීමේදී යම් ප්‍රමාදයන් සිදුවී ඇති බව පිළිගන්නා අතර පෙර වර්ෂවලට සාපේක්ෂව අත්තිකාරම් පියවීම් ප්‍රමාදයන් අවමවී ඇත. ඉදිරියේදී තවදුරටත් මෙම ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | | (iii) | එකතුව රු. 840,500 ක් වූ අත්තිකාරම් 14 ක් 2018 දෙසැම්බර් 10 වන විටත් සම්පූර්ණයෙන්ම පියවා නොතිබුණි. | සියලුම අත්තිකාරම් දෙසැම්බර් 31 දින වන විට පියවා ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | | (iv) | ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව අත්තිකාරම් ලබා දීම නිසා අවස්ථා 6කදී ලබා ගත් අත්තිකාරම්වලින් සියයට 40ත් සියයට 100 ත් අතර ප්‍රමාණයක් ඉතිරි වී නැවත පියවා තිබුණි. | පාලක සභා, අනෙකුත් අනු කමිටු රැස්වීම් හා සම්මුඛ පරීක්ෂණ සඳහා ඇතැම් විට සාමාජිකයින්ගේ නොපැමිණීම මත ලබා ගත් මුළු අත්තිකාරම උපයෝගීවීමක් සිදු නොවේ. එසේම ඇතැම් අවස්ථාවන්හිදී අදාළ අනු කමිටුව රැස්වීමට නියමිත ආසන්න දිනයක දී අවලංගුවීම මත සම්පූර්ණ අත්තිකාරම නැවත පියවීම සිදුවී ඇත. | නිවැරදි ඇස්තමේන්තු මත අත්තිකාරම් ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(අ) ඡේදය | (i) ප්‍රසම්පාදන කමිටුවේ රැස්වීම් පැවැත්වීමේදී ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් තිදෙනාට අමතරව ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයන් නොවන නිලධාරීන් තුන්දෙනෙකු සහභාගී කර ගෙන තිබුණු අතර ඉන් එක් අයෙකු ප්‍රසම්පාදන කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කර තිබුණි. | වැඩ ඉංජිනේරු සහ සහකාර ලේඛකාධිකාරී ද උක්ත තාක්ෂණික කමිටුවේ සාමාජිකයින් වන අතර, ආයතන ප්‍රසම්පාදන කමිටුවේ ඉල්ලීම පරිදි තාක්ෂණික ඇගයීම් වාර්තාවේ පැහැදිළි කිරීම් සඳහා පමණක් අදාළ අවස්ථාවන්හිදී එම නිලධාරීන් සහභාගී වන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | | (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයන් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් ලෙස කටයුතු නොකල යුතු වුවත් එයට පටහැනිව ඉහත (i) හි සඳහන් නිලධාරීන් තාක්ෂණික ඇගයීම් කමිටු සභාපති හා කමිටු සාමාජිකයින් ලෙස ද කටයුතු කර තිබුණි. | වැඩ ඉංජිනේරු සහ සහකාර ලේඛකාධිකාරී ද උක්ත තාක්ෂණික කමිටුවේ සාමාජිකයින් වන අතර, ආයතන ප්‍රසම්පාදන කමිටුවේ ඉල්ලීම පරිදි තාක්ෂණික ඇගයීම් වාර්තාවේ පැහැදිළි කිරීම් සඳහා පමණක් අදාළ අවස්ථාවන්හිදී එම නිලධාරීන් සහභාගී වන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 26.1 උපවගන්තිය | උසස් අධ්‍යාපන ආයතන මඟින් අනන්‍ය වූ ආයතනවලින් බාහිර කථිකාචාර්යවරුන් ලබා ගැනීම අධෛර්යමත් කළ යුතු බව දක්වා ඇති නමුත් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අනුමත කථිකාචාර්ය තනතුරු 55ට අමතරව බාහිර කථිකාචාර්යවරු 42දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබූ අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.4,900,123ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. | මෙම තත්ත්වය 2018 පළමු සමාසිකය තුළ ඉහළ අගයක් ගත් නමුත් ආචාර්ය මණ්ඩලයේ නව බඳවා ගැනීම් හේතුවෙන් දෙවන සමාසිකය වන විට සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවී ඇති බව පෙන්වා දෙමි. | පුරප්පාඩු පියවීම සඳහා කඩිනම් පියවර ගෙන බාහිර කථිකාචාර්ය වියදම් අඩුකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,187,367 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.8,665,039 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,477,672 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මිශ්‍ර ලැබීම් රු. 5,950,192 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යන බාහිර පාඨමාලාවලින් ඉකුත් වර්ෂයේ ලබා තිබුණු ආදායමට වඩා සියයට 20.34 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණු නමුත් ඉකුත් වර්ෂයේ වියදම සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ වියදම සියයට 46.75 කින් වැඩි වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ රු. 334,381,456 ක් වූ සමස්ථ වියදම සමාලෝචිත වර්ෂයේදී රු. 397,844,021 ක් දක්වා සියයට 18.97 කින් වැඩිවී තිබුණු අතර බාහිර ව්‍යාපෘති වියදම සියයට 46.75 කින් ඉහළ යාම මෙම වියදම් වැඩි වීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

**(අ) ජංගම අනුපාතය**

සමාලෝචිත වර්ෂයේ මුළු ජංගම වත්කම් රු. 98,913,834 ක් ද, ජංගම වගකීම් රු. 57,944,783 ක්ද වූයෙන් ජංගම අනුපාතය 1.7 : 1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය 1.1 : 1 ක් වශයෙන් පැවති බව නිරීක්ෂණය විය.

**(ආ) ක්ෂණික අනුපාතය**

සමාලෝචිත වර්ෂයේ මුළු ද්‍රවශීල වත්කම් රු. 91,565,383 ක් ද, ජංගම වගකීම් රු. 57,944,783 ක්ද වූයෙන් ක්ෂණික අනුපාතය 1.58 : 1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය 0.97 : 1 ක් වශයෙන් පැවති බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 4 (XV) වගන්තිය අනුව කුලී සහ බදු පදනම යටතේ වුව ද නේවාසිකාගාර පහසුකම් සපයා ගැනීමට ඉඩකඩ | දැනට කුලී පදනම මත නේවාසිකාගාරයක් ලබා ගැනීමට පුවත්පත් දැන්වීම් සහ ලේඛන සකස් කර | නේවාසිකාගාර සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකර |

| | | | |
|---|---|---|---|
| | තිබියදීත් එය නොසලකා විශ්වවිද්‍යාලයට අයත් නේවාසිකාගාරවල ඉඩකඩ පමණක් සැලකිල්ලට ගෙන බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව සීමා කිරීමට කටයුතු කර තිබුණි. අභ්‍යන්තර ශිෂ්‍ය බඳවා ගැනීම් පිළිබඳ තොරතුරුවලට අනුව ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ බඳවා නොගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඉල්ලුම්කළ ශිෂ්‍ය සංඛාවේ ප්‍රතිශතයක් වශයෙන් පිළිවෙලින් සියයට 51.3 ක් සහ සියයට 58.7 ක් වී තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් උපරිම ඵලදායීතාවයකින් යුතු අධ්‍යාපනයක් ලබාදිය හැකි පරිදි උපරිම අධ්‍යාපනයක් ලබාදිය හැකි පරිදි උපරිම ශිෂ්‍ය සංඛාවක් බඳවා ගැනීම පිළිබඳව කළමනාකරණයේ ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා යොමුකර තිබුණි. සුදුසුකම් ලබන සිසුන් උපරිම වශයෙන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි ආකාරයට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පරිශ්‍රයේ පොදු පහසුකම් ගොඩනැගිල්ලේ කිලෝවොට් 25 ක සූර්ය බල පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2017 වර්ෂයේ රු. මිලියන 3 ක් වෙන්කර තිබුණු නමුත් වැඩ ඉංජිනේරුගේ අභිමතය පරිදි ධාරිතාවය කිලෝවොට් 50 ක් විය යුතු බවට තීරණය කර 2017 දෙසැම්බර් වන විට කිලෝවොට් 58 ක පද්ධතියක් ස්ථාපිත කර අවසන් කර තිබුණි. ඒ සඳහා අදාළ සමාගමට වැට් රහිතව රු. 7,827,540 ක් ගෙවා තිබුණි. එසේ වුවද මෙම පද්ධතිය මඟින් අපේක්ෂා කළ විදුලි වියදම අඩු කිරීමේ පරමාර්ථය ඉටුකර ගැනීම වෙනුවට 2017 විදුලි වියදමට වඩා සමාලෝචිත වර්ෂයේ රු. 111,509 ක විදුලි වියදමක් දැරීමට විශ්වවිද්‍යාලයට සිදුව තිබුණු බැවින් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත කාර්යසාධනය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි විය. | විශ්වවිද්‍යාලයේ පොදු පහසුකම් ගොඩනැගිල්ලේ කිලෝවෝට් 58 DC ධාරිතාවයෙන් යුත් සූර්යබල පද්ධතියක් ස්ථාපනය කළ ද එම පද්ධතිය කිලෝවෝට් 50 AC ධාරිතාවයෙන් යුත් පද්ධතියක් වේ. 2018 වර්ෂයේදී භාෂා නිපුනතා සංවර්ධන අධ්‍යන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භකර ඇති බැවින් 2017 වර්ෂයට සාපේක්ෂව විදුලි ඒකක ගණන වැඩිවී ඇත. මාසිකව සූර්ය බල පද්ධතිය මගින් කිලෝවෝට් 50 AC ධාරිතාවයක් උත්පාදනය කරන අතර ඊට අමතරව සිදුකරන විදුලි නිෂ්පාදනය සඳහා විදුලිබල මණ්ඩලය මගින් ආයතනය වෙත රු.65,097 ක් ගෙවීම් කර ඇත. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමේදී අවම පිරිවැයකින් උපරිම කාර්යක්ෂමතාවයක් ලබා ගැනීම වෙනුවෙන් ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | 2015 සහ 2016 වර්ෂවලදී කොන්ත්‍රාත් වෙනුවෙන් රඳවා ගෙන තිබූ එකතුව රු. 993,858 ක් වූ රැඳවුම් මුදල් නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත් ආයතනය මගින් රැඳවුම් මුදල් නිදහස් කිරීමට අදාළ කටයුතු ප්‍රමාද වූ බැවින් රැඳවුම් මුදල් නියමිත දිනට නිදහස් කර නොතිබුණි. | රැඳවුම් මුදල් නියමිත කාලපරිච්ඡේදය අවසානයේදී නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විධිමත් විනය පරීක්ෂාවකින් තොරව විශ්වවිද්‍යාලයේ 363 වන පාලක සභාවේ තීරණයක් අනුව 2013 මාර්තු 20 වන දින සේවය අවසන් කර තිබුණු ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරයකු කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් පවරා තිබුණු අතර 2016 අප්‍රේල් 27 දින එම නිලධාරියාට රු. 1,534,217 ක් ගෙවීමට හා වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනයේදී ඔහු විශ්‍රාම ගියාසේ සලකා විශ්‍රාම ගැන්වීමේ ලිපියක් ප්‍රදානය කිරීමට එකඟ වී නඩුව සමථයකට පත්කර ගෙන තිබුණි. සමථයට එළඹෙන අවස්ථාවේදී එම නිලධාරියා භාරයේ පැවති රු. 173,694 ක කාර්යාල උපකරණ සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාලීය වාර්තා අනුව අර්ථසාධක අරමුදල් නිසි ලෙස ගණනය කර ඇති අතර, අදාළ අඩු කිරීම්ද නිසි පරිදි සිදුකර ඇත. අර්ථසාධක අරමුදල ගෙවීමට කිහිප වතාවක්ම (07 වරක්) උත්සාහ දරා ඇති අතර, විවිධ හේතු දක්වමින් එය භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත. මෙම තත්ත්වය පාලක සභාව වෙත යොමු කොට ඉදිරි තීරණයක් ගැනීමට නියමිතය. | නිලධාරියකුගේ විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු සේවය අවසන් කිරීම හෝ නොකිරීම තීරණය කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවාව වෙනුවෙන් රු. 11,048,029 ක් වැයකර තිබුණද අදාළ ගිවිසුම අනුව පීඨ පරිශ්‍රයේ නේවාසිකාගාර ආශ්‍රිතව ස්ථාන 11 ක් සඳහා ප්‍රධාන ආරක්ෂක නිලධාරියකු හා කණිෂ්ඨ ආරක්ෂක නිලධාරීන් 15දෙනෙකු සේවා මුර ක්‍රමයට සේවය සඳහා යෙදවිය යුතු නමුත් පීඨ පරිශ්‍රයේ අදාළ ස්ථාන 11 සඳහා කණිෂ්ඨ ආරක්ෂක නිලධාරීන් 9දෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. | දැනට මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා පරිශ්‍ර 3 හි නිලධාරීන් 3 දෙනෙකු සමීප අධීක්ෂණ කටයුතු සිදු කරන අතර අදාළ ආයතනය වෙත අවවාද සහිත දැනුවත් කිරීම් සිදුකර ඇත. තවද නොපැමිණි ඇති දින සඳහා ගිවිසුම අනුව වැටුප් අඩුකරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව සේවා සපයන බවට තහවුරු කරගත යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ බාහිර හා අභ්‍යන්තර උපාධි පිරිනැමීම පිළිබඳ සලකා බැලීමේදී බාහිර විභාග අංශය විසින් ඉකුත් වර්ෂයේ සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි 228 ක් සහ පශ්චාත් උපාධි 88 ක් පිරිනමා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඒවා පිළිවෙලින් 72 ක් සහ 51 ක් දක්වා පහත වැටී තිබුණි. ඉකුත් වර්ෂයේ අභ්‍යන්තර විභාග අංශය විසින් සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි සහ විශේෂ ශාස්ත්‍රවේදී උපාධි 89 ක් පිරිනමා තිබුණු | බාහිර විභාග අංශය විසින් ඉකුත් වර්ෂයේ සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධියේ 228 ක් හා පශ්චාද් උපාධි 78 ක් පිරිනමා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී පශ්චාද් උපාධිසඳහා දෑ අවුරුදු පාඨමාලාවට සිසුන් විශාල ලෙස පෙළඹවීම මත වාර්ෂික උපාධි ලබා ගැනීමේ විචලනයක් දක්නට ඇත. | විශ්වවිද්‍යාලයේ බාහිර හා අභ්‍යන්තර විභාග අංශවල කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| නමුත් සමාලෝචිත වර්ෂයේදී එය 55 ක් දක්වා පහත වැටී තිබුණි. තවද පසුගිය වසර 5 තුළ බාහිර හා අභ්‍යන්තර උපාධි පිරිනැමීම පිළිවෙලින් 1,859 ක් හා 353 ක් වීමෙන් අභ්‍යන්තර උපාධි පිරිනැමීමේ කාර්යසාධන මට්ටම සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | 2012 ට පෙර බඳවා ගත් සිදුන් පුනර් පරීක්ෂණවලට පෙනී සිට උපාධිය සමත් වී ඇත. 2016 නවක සිදුන් බඳවා ගෙන ඇති අතර ඔවුන්ගේ ප්‍රතිඵල 2019 වර්ෂයේදී නිකුත්වීමට නියමිතය.<br>2013, 2014 හා 2015 වර්ෂවල සාමාන්‍ය ශාස්ත්‍රවේදී බාහිර උපාධි සඳහා සිසුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව තාවකාලිකව නතර කර තිබුණි. ඒ හේතුවෙන් 2018 උපාධිධාරීන්ගේ ප්‍රමාණය අඩුවී ඇත. අභ්‍යන්තර විභාග අංශයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව සකස් කරන විට දෙවන සමාසික විභාග පරීක්ෂණයන්හි ප්‍රතිඵල නිකුත් කර නොතිබුණු බැවින් 2018 උපාධිධාරීන් පිරිස 55 වශයෙන් දක්වා තිබුණි. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| බාහිර විභාග අංශය පිහිටි කොළඹ පරිශ්‍රයේ පස්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 307.5 ක්ද, හෝමාගම පරිශ්‍රයේ විදේශීය සිසුන් වෙනුවෙන් නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 2019 ක්ද වූ ඉංජිනේරු ඇස්තමේන්තු මත සැලසුම් නිර්මාණය සහ ඉදිකිරීමේ ප්‍රසම්පාදන ක්‍රමය යටතේ කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට අවශ්‍ය ටෙන්ඩර් ලියවිලි සකස් කිරීමේ කාර්යය සඳහා පිළිවෙලින් රු.548,902 ක් සහ රු.379,334 ක් ඉකුත් වර්ෂයේ උපදේශන ආයතනවලට ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ ඉදිකිරීම් ආරම්භකර නොතිබුණි. | 2018 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබීම මත මෙම ව්‍යාපෘතීන් ආරම්භ කළ නොහැකි විය. 2019 වර්ෂයට ප්‍රතිපාදන වෙන්කර ඇති අතර අදාළ ප්‍රසම්පාදන කටයුතු අවසන් අදියරේ පවතී. | සැමවිටම ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතු වේ. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 212 ක් වූ අතර ඉන් නිලධාරීන් 35 දෙනෙකුට අදාළ තනතුරු පුරප්පාඩුවී පැවතුණි. | මහාචාර්ය තනතුරු 07 සඳහා පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවීම සිදුකරන ලද නමුත් අයදුම්පත් ඉදිරිපත් නොවීම මත බඳවා ගැනීම් මෙතෙක් සිදු නොවී ඇත. බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය විෂය සඳහා වූ කතිකාචාර්ය තනතුර සඳහා අභියාචනාධිකරණයේ නඩුවක් ගොනුකර ඇති බැවින් එම තනතුර පිරවීමට නොහැකිය. අනධ්‍යන කාර්ය මණ්ඩල තනතුරු සහ සහකාර මූල්‍යාධිකාරී, ජ්‍යේෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරුවල පුරප්පාඩු පිරවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) 2015 මාර්තු 30 දින සිට විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පැවති පුස්තකාලයාධිකාරි තනතුර සඳහා සප්ත වාර්ෂික නිවාඩු ලබා ඇති වෙනත් විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරිවරයකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන 2017 අප්‍රේල් සිට 2018 මාර්තු දක්වා රු. 674,343 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අදාළ තනතුර පුරප්පාඩුව පැවතුණි. | පුවත්පත් දැන්වීම් පළ කර ලැබී තිබුණු අයදුම්පත් අතරින් එක් අයදුම්කරුවකු පමණක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 921 ප්‍රකාරව සුදුසුකම් සපුරා තිබුණි. එම අයදුම්පතෙහි 2 සහ 3.1 කොටස් ඇගයීම් සිදුකර ඇත. ඒ අනුව පුස්තකාලයාධිකාරී තනතුර සඳහා අවශ්‍ය ලකුණු ලබා ගෙන නොමැත. | අදාළ තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 05 ක තත්‍ය වියදම රු.මිලියන 110.4 ක් වූ අතර ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 66.8 ක් වූයෙන් ඇස්තමේන්තුගත වියදම සහ තත්‍ය වියදම අතර සියයට 19 සිට සියයට 225 අතර පරාසයක විචලතාවයක් විය. | ඇස්තමේන්තු නැවත සංශෝධනය කළ අතර වැටුප් වැඩිවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන පමණක් අතිරේකව ලබාදී ඇත. | නිවැරදිව පුරෝකථනය කර ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණ ද තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළඟා වීමට සැලැසුම් සකස් කිරීමේ හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය. | මේ පිළිබඳ ඉදිරි කටයුතු සාර්ථකව ඉටුකිරීම සඳහා 117 වන විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ මත කමිටුවක් පත්කිරීමට අදාළ පාලක සභා පත්‍රිකාව යොමු කොට ඇත. මේ වන විට විශ්වවිද්‍යාලය විසින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු සිදුකර ඇත. | තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |